(c) www.sinhalalyrics.com

පානම්පත්තුවේ ඩිංගිරි අම්මාය
ගමේ අයට නම් ගජමන් නෝනාය
කව්කර කියන්නේ දැහින් දුටු දේය
වට වන්දනාවෙදි නඩයම දුටු දේය

වදිනට ගිය කලට නුවරට දළදාව
ගමේ චන්ඩි ස්ටැන්ලි ද සිටියාය
යාළු නිලමෙලා දොර හැර දුන්නාය
ලගටම ගිහින් ඔහු දළදා වැන්දාය

හම්බන්තොටින් පසුකර ලුණු ලේවාය
කතරගමට අපි යහතින් ආවාය
සිටියදි පෝලිමේ අපි ගෙන පූජාව
සීයේ කොල වලට මුල්තැන ලැබුනාය

සිරිමා බෝධියට ගියදා උදයේම
කාර් ගොඩක් ආවා එක එක පාට
තෙරපී සිටිද්දී අපි පඩිපෙල ගාව
ඒ මහතුග රන්වැට පැන වැන්දාය

පද රචනය - සුනිල් ආරියරත්න
සංගීතය - ඔස්ටින් මුණසිංහ